# ආයුබෝවන් Melsta!

*The official Newsletter of Melsta Hospitals*

පළමු වෙළුම

2021 දෙවන කාර්තුව




## ප්‍රවේසමෙන් වැඩ කිරීම කාගේ වගකීමක්ද ?

## KIDNEY CARE CENTER

## SIX BASICS FOR CUSTOMER SERVICE.

## BUSINESS DEVELOPMENT

## FOOD SAFETY

## COVID 19 CORONA VIRUS

**MELSTA HOSPITALS RAGAMA (PVT) LTD**

NO. 43, MAHABAGE ROAD, RAGAMA, TEL : 0115 100 000 | FAX : 0112 952 380



# Editor talks

''ආයුබෝවන් Melsta'' is an effective forum to facilitate communication among the staff, and I believe that having an effective communication system well-implemented will solve many problems and uncertainty among staff in any organization. On the other hand, customers are also being taken care of as a result of that.

Therefore, in the quarterly publications of Aubowan Melsta, we expect to share numerous information on a wide range of topics. Information about the hospital such as the details of its development and expansion of operations, strategies, partnerships, achievements and its recognitions will be an important aspect of this newsletter. Some features that will aid in personal development but also may not necessarily confine it to job-related aspects of staff. An extension to this, spiritual and religious development of staff will be considered as well as beneficial health tips. Other features would be interesting articles on special staff interviews, creative corners to name a few.

Your active participation in the Ayubowan Melsta will certainly be its success. Anyone could write to this on any related topic, a new face for effective & interactive staff communication. We hope all of you enjoy this first edition of the newsletter, and we would be glad to consider your feedback for improvement.

''ආයුබෝවන් මෙල්ස්ටා'' යනු කාර්ය මණ්ඩලය අතර සන්නිවේදනය පහසු කිරීම සඳහා ඵලදායී මෙවලමක් වන අතර, මනා ලෙස ගොඩනැංවූ ඵලදායී සන්නිවේදන පද්ධතියක් තිබීම තුළින් කාර්ය මණ්ඩලය අතර අවිනිශ්චිතතාවයන් ඇතුළු බොහෝ ආයතනික ගැටළු විසඳනු ඇතැයි මම විශ්වාස කරමි. එවන් ඕනෑම ආයතනයක පාරිභෝගිකයන් යෙහෙන් රැකබලා ගැනෙන බව මම තරයේ විශ්වාස කරමි. එබැවින්, ''ආයුබෝවන් මෙල්ස්ටා'' හි කාර්තුමය ප්‍රකාශනවල, පුළුල් පරාසයක මාතෘකා තුළින් තොරතුරු රාශියක් බෙදා ගැනීමට අපි අපේක්ෂා කරමු.

රෝහල පිළිබඳ තොරතුරු, එහි සංවර්ධනය හා මෙහෙයුම් පුළුල් කිරීම, උපායමාර්ග, හවුල්කාරිත්වයන්, ජයග්‍රහණ සහ එහි පිළිගැනීම් වැනි තොරතුරු මෙම පුවත්පත තුළ වැදගත් අංගයක් වනු ඇත. පුද්ගලික සංවර්ධනයට උපකාරී වන සමහර අංගයන් කාර්ය මණ්ඩලයේ රැකියා ආශ්‍රිත අංශවලට පමණක් සීමා නොවිය හැකිය. මේ සඳහා දිගුවක් ලෙස කාර්ය මණ්ඩලයේ අධ්‍යාත්මික හා ආගමික සංවර්ධනය මෙන්ම සෞඛ්‍යමය ඉඟි යනාදිය ද සලකා බලනු ඇත. තවත් විශේෂාංග වනුයේ විශේෂ කාර්ය මණ්ඩල සම්මුඛ සාකච්ඡා හා සිත්ගත්තා සුළු ලිපි යනාදියයි.

''ආයුබෝවන් මෙල්ස්ටා'' සඳහා ඔබේ ක්‍රියාකාරී සහභාගීත්වය නිසැකවම එහි සාර්ථකත්වය වනු ඇත. ඵලදායී හා අන්තර්ක්‍රියාකාරී කාර්ය මණ්ඩල සන්නිවේදනය සඳහා නව මුහුණුවරකින් ඕනෑම කෙනෙකුට අදාළ ඕනෑම මාතෘකාවකට ලිවිය හැකිය. ප්‍රවෘත්ති පත්‍රයේ මෙම පළමු සංස්කරණය ඔබ සැවොම රසවිඳිනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඔබගේ යෝජනා හා අදහස් අපි බෙහෙවින් අගය කරන්නෙමු.

**Ranjana Gunathilake**
General Manager – Operations
Editor – Ayubowan Melsta



**Team behind Aubowan Melsta**

**Mentor**
Dr. K. T. Iraivan – *Executive Director / CEO*

**Editor**
Mr. Ranjana Gunathilake – *General Manager Operations*

**Deputy Editor**
Mrs. Senisha De Silva – *Manager Human Resources*

**Sub Editors**
Mrs. Gayani Abeysinghe – *Executive – HumanResources*
Ms. Rasika Kumari – *Assistant Manager Quality Assurance*
Mrs. Nipunika Fernando – *Executive Marketing*
Dr. Thiloka Gamage – *Medical Officer*

**Correspondence and enquiries**
Mrs. Gayani Abeysinghe




මෙම පුවත් පතෙහි, උවමනාවෙන්ම නිවැරදි නොකරන ලද දෝෂ සහිත වචන කිහිපයක් සඳහන් වී තිබේ. ලිපි කියවාගෙන යන අතරතුර ඔබට ඇස ගැටුණු එවැනි සියලුම වචන ඔබගේ නම සේවා අංකය සහ දෙපාර්තමේන්තුව සමගින් මානව සම්පත් අංශයට භාර දෙන්න. නිවැරදි කිරීම් වැඩිම ප්‍රමාණයක් සොයා ගනු ලබන්නා ජයග්‍රාහකයෙකු බවට පත්වේ.
In this newspaper, there are some erroneous words that were not intentionally corrected. Submit all such words that you come across while reading the articles with your name, HRIS number and department to the HR Department. The one who finds the most corrections become the winner.



## Message from Executive Director/CEO

Dear Colleagues & Friends,

It is my absolute pleasure to bring you the first edition of the newsletter of Melsta Hospitals "ආයුබෝවන් Melsta"

Melsta hospitals is a fully owned subsidiary of Melsta Health (Pvt) Ltd, owned by Melsta Corp PLC which is the largest conglomerate in Sri Lanka. As part of the Melsta Health family I am proud that we were able to publish this newsletter for Melsta Hospitals, as a start of a new initiative.

The vision of this newsletter is to create a platform for every one of you to share your talents and knowledge among your fellow colleagues and get to know the new initiatives at Melsta Hospitals and Melsta Health Group. Further, I wish this will help to build our unity and team work along with flow of information among us. Adding more to this, we have opened doors for the family members of our staff to take part in the newsletter by sharing their creativity as well. By doing that I am hoping that it will enhance and develop relationship of Melsta hospitals as a family.

I believe the past year has been a challenging year for everyone and this year hasn't been much different than last year, but I would like to say that regardless of the situation, we at Melsta Hospitals have been able to steer through these challenging times with the help and dedication of all of you. For that I am thankful to each and every one of you. I anticipate that all of you will continue to give your very best to the company to make it a profitable venture while serving the needy people for their health care requirements in the future too.

I would like to thank the team behind this newsletter for making it possible. I expect all of you will keep contributing to this newsletter and learn new things from it as well.

Wishing everyone of the Melsta Hospitals family good health & prosperity!

**Dr. K. Thiyagarajah Iraivan**
Executive Director / Chief Executive officer.



## Message from Director Medical Services



Whether the place where we work is small or big is no matter, loneliness is the same. You will realize, your true inner happiness does not come from material things of the surrounding.

Remember the following proven facts of life:

Don't educate your children to be rich. Educate them to be happy. So when they grow up, they will know the value of things, not the price. If you are health conscious always remember to "Eat your food as your medicines. Otherwise you have to eat medicines as your food". The ones you love will never leave for another because even there are hundreds of reasons to give up, he or she will find one special reason to hold on to you.

There is a big difference between a human being and being human. Only a few people really understand the difference between these two. You are loved when you are born. You will be loved when you die. But In between period you have to manage by yourself! Therefore if you just want to walk fast, walk alone! But if you want to walk far, walk together! Remember the six best friends, sunlight, Rest, Exercise, self-confidence, Diet and friends. Always try to get closer to them and enjoy a healthier life.

**Doctor Upul Ilangasinghe**
Director Medical Services

## Message from the Manager Human Resources



The main purpose of the "ආයුබෝවන් Melsta" newspaper creation was to share the hospital's internal information with the staff. The newspaper will be available to you every three months as a platform to share with you the unique achievements and plans of the team's success in the hospital as a team and to develop your creative skills.
A boat does not go forward if each one is rowing their own way. So, we should go together as one team towards one ambition! I believe that this will be a great platform to all employees to develop communication among the Melsta Hospitals Ragama.

**Senisha De Silva**
Manager Human Resources

## Message from Chief Nursing Officer



I take this opportunity to convey my sincere congratulation to "Ayubowan Melsta" for successfully launching the first episode of it. It has been a highly appreciable effort, which has given all Melsta staff a platform to highlight their talents, and it opens the avenues to publicize achievements and updates of the organization. I highly appreciate all the members who are ready to shed their sweat for the betterment of the magazine continuously being behind the scenes. I am ready to extend my gratitude to the General Manager Mr. Ranjana Gunathilaka and HR team who supported to make the magazine a reality. And also I am grateful to our Executive Director Dr. K.T Iraivan for giving the great idea to start such a thing on behalf of the all staff. Specially in this global pandemic situation, as we perform our duties as responsible healthcare professionals, abiding by the guidelines of Sri Lanka Ministry of Health to serve and protect our loved ones as well as the proud citizens of the country.

**Mrs. Subashini Ranasinghe**
Chief Nursing Officer

My Hospital

# මගේ රෝහල

රාගම නගර මධ්‍යයේ පිහිටා ඇති මෙල්ස්ටා රෝහල හැරී ජයවර්ධන මැතිතුමන්ගේ අතිවිශාල වූ සාර්ථක ව්‍යාපාර ජාලයට එක්වුණු නවතම ආයතනය ලෙස හැඳින්විය හැකිය. අති නවීන තාක්ෂණයෙන් ද, සියලුම වෛද්‍ය සහ රසායනාගාර සේවාවන් ද දැරියහැකි මිලකට ලබාදෙමින් රාගම මෙල්ස්ටා රෝහල සුව සත්කාර සේවයේ නවමු අත්දැකීමක් සිය පාරිභෝගිකයන්ට ලබාදෙමින් සිටී. වසර 7ක ඉතිහාසයක් හිමි අපගේ රෝහල වර්ෂ 2020 පෙබරවාරියේ දී මෙල්ස්ටා කෝප් හිමිකාරිත්වයට නතුවේ.

ඊට පෙර අප රෝහල අයත්ව තිබුණේ බ්‍රවුන්ස් ව්‍යාපාර ජාලයට වන අතර වර්තමානයේ දී අප රෝහල හැරී ජයවර්ධන මැතිතුමන්ගේ ඇති දැවැන්ත ව්‍යාපාර සමූහයේ සාමාජිකයෙකු බවට පත්ව ඇත.

## අප රෝහලේ වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය


**Mr. R. Jansz**
Chairman


**Dr. K.T. Iraivan**
Executive Director


**Mr. Aruna Jayakody**
Executive Director


**Mr. Hasitha jayawardana**
Director


**Mr. Amitha Goonerathne**
Director

ජාත්‍යන්තරව පිළිගත් ISO 9001: 2015, ISO 22000: 2018 , ISO 14001:2015, ISO 45001: 2018 තුළින් ප්‍රමිතිකරණය කරන ලද විශිෂ්ට රෝගී සත්කාරයක් ලබා දෙන කලාපයේ ප්‍රථම සහ එකම රෝහල මෙල්ස්ටා රෝහලයි. අප මෙල්ස්ටා කෝප් සමාගමට අයත් වීම සවිමත් සුවවත් සබැඳියාවක් තහවුරු කරයි.

## මෙල්ස්ටා කෝප් අධ්‍යක්‍ෂක මණ්ඩලය


**Mr. D.H.S. Jayawardena**
Chairman


**Mr. A.L. Gooneratne**
Managing Director


**Mr. C. R. Janz**
Executive Director


**Dr. A.N. Balasuriya**
Independent Non - Executive Director


**Mr. D. Hasitha S. Jayawardena**
Independent Non - No Executive Director


**Mr. N. De S. Deva Aditya**
Independent Non - Executive Director


**Capt.K.J. Kahanda** (Retd.)
Non - Executive Director


**Mr. R. Seevaratnam**
Independent Non - Executive Director


**Ms. V.J. Senaratne**
Alterate Director to Mr. N. de S. Deva Aditya

අප අයත් වන ඇති දැවැන්ත ව්‍යාපාර සමූහය ශ්‍රී ලාංකීය පුරවැසියන් 24,000 කට ආසන්න ප්‍රමාණයකට රැකියා අවස්ථාවන් ලබාදෙමින් දිනෙන් දින සාර්ථකත්වය කරායන මාවතක ඉදිරියටම ගමන්ගනිමින් සිටී.


**ගයනි අබේසිංහ**
විධායක නිලධාරිනී
මානව සම්පත් අංශය

"මෙලස්ටා කෝප් අප මව් සමාගම පිළිබඳ ආයුබෝවන් මෙල්ස්ටා ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න....
Expect more details about our mother company of Melsta Corp from the next news letter."

# VISION MISSION

## ආයතනයක දැක්ම සහ මෙහෙවර යනු කුමක්ද ?

ඕනෑම ආයතනයක් දිගු කාලීනව අත්කර ගැනීමට අපේක්ෂා කරනු ලබන දෙය දර්ශන ප්‍රකාශයකින් (Vision Statement) විස්තර කෙරේ. එය අනාගතයේ දී ආයතනය කෙබඳු වනු ඇත්ද යන්න පිළිබඳ දැක්මක් නිරූපණය කරන අතර ආයතනික මට්ටමේ උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත දිශාවක් නියම කරයි.

මෙහෙවර ප්‍රකාශයක් යනු (Mission Statement) ආයතනයක මූලික අරමුණ ළඟාකර ගැනීම පිළිබඳ හා එහි ප්‍රවේශය පිළිබඳ කෙටි විස්තරයකි. මෙහෙවර ප්‍රකාශය මඟින් සමාගමේ අරමුණු සංවිධානයේ සිටින අයට සහ මහජනයාට ප්‍රකාශ කරයි.

Melsta Hospitals-Ragama
A Member of Melstacorp PLC

## අප රෝහලේ දැක්ම සහ මෙහෙවර කුමක්ද?

### Our Vision — අපගේ දැක්ම

To be the most preferred and trusted healthcare partner for the entire community in the region by offering an unparalleled experience of personalised care and committing to pursue excellence.

පුද්ගල කේන්ද්‍රීය අසමසම අත්දැකීමක් තුළින් විශිෂ්ට සුව සත්කාර සේවාවක් ලබාදෙන සමස්ථ කලාපයේම ජනතාවගේ විශ්වාසය දිනාගත් ප්‍රමුඛතම සෞඛ්‍ය සේවා සපයන්නා ලෙසින් විශිෂ්ටයා බවට පත්වීම.

### Our Mission — අපගේ මෙහෙවර

We are dedicated to provide superior quality and value priced healthcare solutions with an unrelenting attention to clinical and operational excellence integrated with international standards and compassionate treatment.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත කාරුණික රෝගී සත්කාරය සමග සුසැඳුණු සායනික හා මෙහෙයුම් විශිෂ්ටත්වය තුළින් ඉහල ගුණාත්මක හා පාරිභෝගික කේන්ද්‍රීය මිලගණන් යටතේ වූ සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා කැපවෙමු.

අපගේ දැක්ම සහ මෙහෙවර අනුව යමින්, එකම කණ්ඩායමක් ලෙස ක්‍රියාකරමින් අප රෝහල විශිෂ්ටතම සෞඛ්‍ය සේවාවක් සපයන රෝහලක් බවට පත් කරමින්, අපට ද එම විශිෂ්ටතම රෝහලේ කණ්ඩායමට අයත් කෙනෙකු වීමට අනිවාර්යෙන්ම හැකියාව තිබේ.



**ගයනි අබේසිංහ**
විධායක නිලධාරිනී
මානව සම්පත් අංශය

# BUSINESS DEVELOPMENT

සුවපත්, සව්මත් සබැඳියාවක් සමගින් අප මෙල්ස්ටා රෝහල එහි ඉදිරි දැක්ම සහ අරමුණු සාර්ථක කර ගැනීමට ස්ථාවර ගමනක නියැලෙමින් සිටී. හදිසි ප්‍රතිකාර අංශය (ETU), බාහිර රෝගී අංශය (OPD), නේවාසික ප්‍රතිකාර පහසුකම් (IP), ICU සහ Radiology යනාදී ප්‍රධාන අංශ ගණනාවකින් සහ General, VOG මෙන්ම Orthopedic ශල්‍යකර්මයන් හා විවිධ වෛද්‍ය සේවාවන් රැසක් සපයන, කලාපයේ දැරිය හැකි මිලකට අමිල සේවාවක් ලබාදෙන රෝහලක් වශයෙන් අප රෝහල සුවහසක් සුවපත් රෝගීන්ගේ / සේවා දායකයින්ගේ අඛණ්ඩ විශ්වාසය දිනාගෙන ඇති ප්‍රමුඛ පෙලේ රෝහලකි.

එමෙන්ම මෙල්ස්ටා රෝහල අතිදක්ෂ කාර්ය මණ්ඩලයකින් / වෘත්තීයවේදීන් සහ අති නවීන තාක්ෂණයෙන් යුත් පහසුකම්වලින් පරිපූර්ණ වූ මෙන්ම ඉහලම මට්ටමේ විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත විශ්වාසදායී සේවාවක් සපයන රෝහලක් වීම අප සැමගේ ආඩම්බරයට හේතුවන කරුණකි.

පසුගිය වසරේ සමස්ථ ලෝකයාම මුහුණදුන් ඒ අමිහිරි අත්දැකීම් මේ වන විට තෙවන වරටත් අපි සියලු දෙනාම මුහුණ දෙමින් සිටින්නෙමු. නමුත් විවිධ බාධක මධ්‍යයේ වුවද අප සියලුම සාමාජිකයින්ගේ දැඩි කැපවීම, උත්සාහය සහ නව්‍යකරණය මෙන්ම අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් හා අධීක්ෂණය තුලින් අප රෝහල මේ වන විට කලාපයේ තරගකාරී ආයතනයක් ලෙස නොසැලී සාර්ථකව ඉදිරියට යමින් තිබේ.

මෙල්ස්ටා සමූහ සමාගමේ (Melstacorp PLC) ශක්තියෙන් බලගැන්වූ එහි ප්‍රධාන අනුබද්ධිත ආයතනයක් වන මෙල්ස්ටා රෝහල මේ වන විට එහි සේවා අංශ තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. ඒ සඳහා විශාල ආයෝජනයන් සැලසුම් කර ඇති අතර මේ වන විටත් එහි පළමු අදියර ලෙස පරිපූර්ණ පහසුකම් වලින් සමන්විත GI අංශය (Gastroenterology) නිර්මාණය කර ඇති අතර දැනට එහි ඉදිකිරීම් සාර්ථකව අවසන් කර තිබේ. ඉහළ ආයෝජන වටිනාකමක් සහිත අපගේ GI අංශය නවීන තාක්ෂණයෙන් යුත් වෛද්‍ය උපාංග වලින් සමන්විත කලාපයේ තිබෙන එකම පරිපූර්ණ GI අංශය වීම අපහට ආඩම්බර විය හැකි කරුණකි. එම අංශයේ සේවා කටයුතු නුදුරු අනාගතයේදීම සමස්ථ ප්‍රජාවට විවෘත කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබේ.

එතෙකින් නොනැවතුන අප, ඉතිහාසයේ පළමු වතාවට වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම කිහිපයක්ම අති සාර්ථකව සිදුකර තිබීම මෙල්ස්ටා රෝහලේ සාමාජිකයන් ලෙස ආඩම්බර විය හැකි ඉහළ මට්ටමේ ළගාකර ගැනීමක් වශයෙන් සඳහන් කළ හැක. මෙල්ස්ටා අප විසින් ඉතා සාධාරණ පිරිවැයකට, මුදලට එහා ගිය සමාජ සත්කාරයක් ලෙසින් අපගේ සේවාවන් සමස්ථ ප්‍රජාව අතරට ගෙනගිය සුවිශේෂී අවස්ථාවක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. එමෙන්ම, වකුගඩු බද්ධ කිරීම් සඳහාම වෙන්වූ නව අංශයක් දැනට ස්ථාපිත කර ඇති අතර නුදුරු අනාගතයේදීම එය තවදුරටත් පුළුල් කර ඉහළ සේවා වාර ගණනක් සහ වැඩි රෝගීන් ප්‍රමාණයකට පහසුකම් සැලසීමට හැකි වන අයුරින් ප්‍රතිස්ථාපනය කිරීමට සියලු කටයුතු සිදුකෙරෙමින් පවතී.

මෙල්ස්ටා රෝහලට අලුතින්ම හඳුන්වා දුන් සේවා අංශයක් ලෙස "UROLOGY" අංශය සඳහන් කළ හැකිය. ඉහළ මට්ටමේ අතිදක්ෂ විශේෂඥ වෛද්‍යවරු විසින් සේවා සපයන මෙම අංශයෙන් සැහීමකට පත්විය හැකි ප්‍රමාණයකින් අපගේ සමස්ථ මූල්‍ය ප්‍රතිඵලවලට දායකත්වයක් ලබා දීමට හැකිවී තිබේ. තවද, මෑතකදී හඳුන්වාදුන් Home-care Service සහ Online pharmacy drug delivery අංශ ද අපගේ ව්‍යාපාර පුළුල් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයන් ලෙස සඳහන් කළ හැකිය.

ව්‍යාපාර ආයතනයක් වශයෙන් පසුගිය කාල පරිච්ඡේදය තුළදී දැඩි අපහසුතාවලට මුහුණ දුන් බව අප සියල්ලන්ම හොඳින් දන්නා කරුණකි. නමුත් ඒ සියලු බාධක වලට අභියෝගාත්මකව මුහුණ දෙමින් අපගේ සියලුම රෝගීන් / සේවා දායකයින් හට ඉහළම සේවාවක් ලබාදීමට තරම් වූ දැඩි කැපවීමක් සහිත සේවක මණ්ඩලයක් අප සතුවන නිසාවෙන්ම සමස්ථ මූල්‍ය තත්වයන් අවම හානියකින් හසුරුවා ගනිමින් අපගේ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන වීමට අපට හැකි වී තිබේ. අප සැමගේ කැපවීම මෙන්ම සහයෝගය සමස්ථ ආයතනයේම අභිවෘද්ධියට බලපාන අතර ඒ තුළින් අපගේ සම්පත් (මානව, මූල්‍යය, උපකරණ හා ක්‍රමෝපායන්) ඉතා කාර්යක්ෂමව සහ සකසුරුවම්ව පරිපාලනය කර ගැනීමට හැකිවෙන බව අප සියලු දෙනාම අවබෝධ කර ගතයුතු කරුණකි.

එමනිසා, අපගේ රෝහලේ ඉදිරි දැක්ම සහ අරමුණු හඳුනාගනිමින් එකම කණ්ඩායමක් ලෙසින් කටයුතු කරමින් අපගේ රෝහල ප්‍රජාවගේ විශ්වාසය දිනාගන්නා, ඉහළ සත්කාරයක් ඇති, කලාපයේ ඉහළින්ම වැජඹීමට හැකි ලාභ උපයන රෝහලක් බවට පත්කර ගැනීමට කටයුතු කිරීම අප සියලු දෙනාගේම හෘදයාංගම උත්සාහය වීම ඉතා වැදගත්ය.



**නිරෝෂන් ප්‍රසන්න**
මූල්‍ය ප්‍රධානි
මූල්‍ය අංශය

## ELECTROSURGICAL UNIT (ESU)

Recently we have purchased Electro Surgical Unit (Diathermy Machine) for GI Center in our hospital which is the latest technology machine with ENDOCUT mode from the manufacturer KLS Martin & can be upgraded argon plasma coagulation module in future.

Electrosurgical units (ESU) use a high-frequency electrical current to cut tissue and control bleeding by causing coagulation. Modern medicine would simply be unthinkable without high-frequency currents in surgery. High-frequency (HF) currents have been known for more than 100 years. As far back as 1890, Tesla, Nernst, d'Ar-sonval and Morton carried out the first experiments dealing with the physiological effects of high-frequency, high-voltage currents. In 1881, Morton found that an oscillating current at a frequency of 100 kHz could pass through the human body without inducing pain, spasm, or burn (Fig. 1).





*Figure 01: Applications of different current frequencies*

Later William T. Bovie was an American scientist who developed the early version of modern-day Electro Surgical Unit and helped bring it to the forefront of the profession. The first use of this device in an operating room was at the Peter Bent Brigham Hospital in Boston, on October 1, 1926, when Dr Harvey Cushing used it to remove an enlarging, vascular myeloma from the head of a 64-year-old patient. Today there are increasing numbers of applications for electrosurgery in the operating theatres.

The well-known Electrosurgical Unit manufacturers are Eschmann, BOWA-electronic GmbH & Co. KG, KLS Martin, Karl Storz, Olympus, Covidien-Valleylab and Erbe. Each brand can be used in all the surgeries but based on the surgery specifications it may be differed from the applications.

Our specially designed KLS martin machine with ENDOCUT mode which can be used for POEM, ERCP, ESD, EMR and Polypectomy endoscopic procedures. Our KLS Martin high-frequency current generator equipped with an automatically controlled system (ENDOCUT mode) has been currently used in endoscopic sphincterotomy (EST). With ENDOCUT mode, each interval of cutting is automatically triggered by the initial electric arc sensor within the ICC 200 and is thus reproducible in duration.

The fractionated cutting mode ENDOCUT is distinguished by alternating cutting and coagulation cycles (Fig 2.1). This facilitates controlled cutting with safe hemostasis throughout the entire dynamic cutting procedure while also supporting surgeons in carrying out their work.





*Figure 02: Brief explanation about Cutting and Coagulation cycles.*

ENDOCUT is a monopolar, high frequency (HF) surgical procedure where a cutting cycle based on two phases is followed by a coagulation cycle (Fig. 2.2). This is an additional enhancement that ensures safe and effective removal of large lesions, in particular large polyps.



**Sheron Vithushan**
*Bio Medical Engineer*
Bio Medical Department

# FOOD SAFETY

# ආහාර සුරක්ෂිතතාවය

ආහාරයක් පරිභෝජනය කිරීමෙන් පසු එමගින් යම් රෝගයක් ඇති නොවන්නේ නම් හා ආහාර මාර්ගයට අනතුරු සිදු නොවන්නේ නම් එය සුරක්ෂිත ආහාරයකි. ආහාර නිෂ්පාදනය හා සැපයුම් ක්‍රියාවලියේ දී සුරක්ෂිතතාවය ස්ථිර කිරීම සඳහා අත්‍යවශ්‍ය වන කරුණු අතර උසස් ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා කිරීම, අමුද්‍රව්‍ය හා පිසින ලද ආහාර සුරක්ෂිතව ගබඩා කිරීම, ආහාර පිළියෙල කිරීමට හා සැපයුම් සඳහා සහභාගි වන පුද්ගලයන්ගේ, පුද්ගලික සනීපාරක්ෂාවන් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.

ආහාර මගින් ඇති වන රෝග හා අනතුරු ජීව විද්‍යාත්මක, රසායනික හෝ භෞතික සම්භවයකින් යුක්ත විය හැකිය. ආහාර මගින් වැළඳෙන බොහෝ රෝග සඳහා බැක්ටීරියා, දිලීර හෝ වෛරස යන ක්ෂුද්‍ර ජීවීන් හෝ පරපෝෂිත ජීවීන් රෝගකාරක වන අතර එම ජීවීන් මගින් වැළඳෙන රෝග ජීව විද්‍යාත්මක සම්භවයකින් යුක්ත වේ. ආහාරයක අඩංගු රසායනික ද්‍රව්‍යයක් මගින් එම ආහාරය පරිභෝජනය කිරීමෙන් පසු අහිතකර සෞඛ්‍ය බලපෑම් ඇතිවේ නම් එම අහිතකර සෞඛ්‍ය බලපෑම් රසායනික සම්භවයකින් යුක්ත වේ. මෙම රසායනික ද්‍රව්‍ය විවිධ ආහාර වර්ගවල ස්වාභාවිකව ද පැවතිය හැකි අතර, ආහාර නිෂ්පාදනයේ දී හෝ බෙදාහැරීමේ දී දැනුවත්ව හෝ නොදැනුවත්ව එක් වු රසායනික ද්‍රව්‍ය වේ. යම් ආහාරයක අඩංගු වී ඇති වීදුරු කැබලි, ලෝහ කැබලි වැනි ද්‍රව්‍ය වලින් පරිභෝජනයෙන් පසු ආහාර මාර්ගයට කැපීම්, සීරීම් වැනි අනතුරු සිදුවිය හැකි අතර එම අනතුරු භෞතික සම්භවයකින් යුක්ත වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව අනාරක්ෂිත ආහාර පරිභෝජනයෙන් ඇති වන අහිතකර බලපෑම් සාමාන්‍ය පාචන තත්වයක සිට පිළිකා තත්වයන් දක්වා විශාල පරාසයක විහිදී ඇති අතර එමගින් විවිධ රෝග වැළඳීමේ අවධානමක් තිබේ.

ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම මූලික සංකල්ප හතරක් මත පදනම්ව ඇත. පිරිසිදු කිරීම්, වෙන් කිරීම, පිසීම හා ශීත කිරීම එම මූලික සංකල්ප වේ. ආහාරයක් පිළියෙළ කිරීමට පෙර ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය නිසි ලෙස පිරිසිදු කිරීම, ආහාර පිළියෙල කිරීමට ගන්නා භාජන හොඳින් සේදීම, ආහාර පිසීමෙන් පසු, ආහාර පිසීමට යොදාගත් ප්‍රදේශයේ පොළොව හා මතුපිට හොඳින් පිරිසිදු කිරීම හා ආහාර පිසීමට පෙර දෑත් හොඳින් සේදීම වැනි පියවර පිරිසිදු කිරීම යන සංකල්පයට ඇතුළත් වේ. නිසි ලෙස පිරිසිදු කිරීම් ජීව විද්‍යාත්මක, රසායනික හා භෞතික යන සියළුම රෝගකාරක හා අනතුරුකාරක ඉවත් කිරීමට වැදගත් ය.

යම් අපවිත්‍ර වූ ආහාරයක ඇති විෂ රසායනික හෝ අහිතකර ක්ෂුද්‍රජීවීන් අනෙක් ආහාර ද්‍රව්‍යවලට එක් වීම වැළැක්වීම යන කරුණු මත වෙන් කිරීම යන සංකල්පය වැදගත් වේ. ආහාර පිසීමට අවශ්‍ය අමුද්‍රව්‍ය වෙන් වෙන්ව ගබඩා කිරීම, විවිධ ආහාර සඳහා වෙන් වූ භාජන හා අනෙක් උපකරණ භාවිතා කිරීම, පිසින ලද ආහාර නිසි ලෙස වෙන් වෙන්ව ගබඩා කිරීම වැනි පියවර මෙයට අතුළත් වේ. විවිධ ආහාර කාණ්ඩ පිසීමේ දී එම ආහාර කාණ්ඩවලට ලාක්ෂණික ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම සඳහා අවශ්‍ය උෂ්ණත්වයන් විද්‍යාත්මකව සනාථ කර ඇත. පිසීම යන සංකල්පය නම් ආහාරයක් එහි අඩංගු අමුද්‍රව්‍යවලට අදාළව රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් විනාශ කළ හැකි උෂ්ණත්වයට පත් වන තුරු පිසීම පදනම් වී ඇත. ආහාර පිසීමෙන් පසු එය සාමාන්‍යයෙන් පැය 4කට වඩා ගබඩා කිරීමට අවශ්‍ය නම් අදාළ උෂ්ණත්වයට සිසිල් කළ යුතු අතර, ආහාර පිසීමට පෙර ද යම් අමුද්‍රව්‍යයක් නිසි ලෙස ශීතකරණයක හෝ අධිශීතකරණයක ගබඩා කළ යුතුය. ශීත කිරීම යන සංකල්පය ඒ මත පදනම් වේ.

ආහාර නිශ්පාදනය හා බෙදාහැරීම සිදුකරන ආයතන ආහාර සුරක්ෂිතතාවයට අදාළ අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීම, පාරිභෝගිකයන් අතර එම ආයතන පිළිබඳ විශ්වාසය දිනා ගැනීමට වැදගත් වේ. මෙල්ස්ටා රෝහල ද 22000 : 2018 යන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ නවතම අන්තර්ජාතික තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.



**සරණි පුෂ්පකුමාර**
පෝෂණවේදිනී

# COVID-19 CORONAVIRUS

## කොරෝනා වෛරසය

මෙය වෛරස් කාණ්ඩයකි. දුස්සාධ්‍ය තීව්‍රශ්වසන සහ ලක්ෂණය කොරෝනා වෛරසය 2 එසේත් නැතිනම් සාර්ස් - කොවි - 02 (Severe Acute Respiratory Syndrome coronavirus 2, SARS CoV 2) යනු පෙරදී 2019 නව කොරෝනා වෛරසය (2019 එන්කොවී) යන තාවකාලික නම මගින් හැඳින්වුනු ධන අභිදිශා තනි-පට ආර්. එන්. ඒ. වෛරසයකි. (Novel corona virus 2019 - CoV)

## කොරෝනා රෝගයේ සම්භවය

සීඝ්‍රයෙන් ලොවපුරා පැතිරීයන මෙම වෛරසයේ ආරම්භය චීනයේ වූහාන් නගරයේ සිදුවිය. සූර්යයාගේ කොරෝනාවලට සමාන සෛල පටකවලින් ඉදිරියට නෙරා එන උල සහිත හැඩය හේතුවෙන් මෙම වෛරසයට කොරෝනා යන නම ලැබී ඇත .මෙය මිනිසුන් මෙන්ම සතුන් අතර ද, පැතිරීමේ අවධානමක් ඇති අතර එය සෙම්ප්‍රතිශ්‍යාව තත්වයේ සිට ඉතා භයානක රෝගී තත්වයක් දක්වා වර්ධනය වීමේ අවධානමක් ඇත. මෙම වෛරසය බෝවීම ඉතා සීඝ්‍රයෙන් සිදුවේ. රෝගී පුද්ගලයෙකු කසින විට, කිවිසින විට වාතය හරහා පැතිර යනු ලබන සියුම් කෙල බිඳිති මගින්, තවත් නිරෝගී පුද්ගලයකුට මෙම රෝගය බෝවිය හැක. මෙහි බීජෝෂණ සමය (රෝගය බෝවීමට ගත වන කාලය) දින 2 - 14 දක්වා පරාසයක දැක්විය හැකිය.

## රෝග ලක්ෂණ හා සංකූලතා

කොරෝනා රෝගයේ රෝග ලක්ෂණ අතර උණ, කැස්ස, උගුරේ වේදනාව, සෙම්ප්‍රතිශ්‍යාව, හුස්ම ගැනීමේ අපහසුතාවය, හිසරදය, ගඳ සුවඳ දැනීමේ රස දැනීමේ අපහසුතාවය සහ අක්ෂි ප්‍රධාහය දැක්විය හැක.

මෙම රෝගයේ සංකූලතා ලෙස නියුමෝනියාව, තීව්‍ර ස්වසන අසාධන තත්වයට පත්වීම, ඉන්ද්‍රියන් අකර්මන්‍ය වීම සහ මරණයට පත්වීම දැක්විය හැක. රෝගී තත්වය තීව්‍ර නොවන අවස්ථාවේ දී දියර වර්ග බහුලව ලබාදීම, ඔක්ෂිජන් ප්‍රතිකාරය ,වේදනා නාශක ලබාදීම සහ රෝග ලක්ෂණවලට අදාලව ප්‍රතිකාර ලබාදීම සිදුකරයි. මෙහි දී ජලය පානය කිරීම සහ හැකිතරම් විවේකීව සිටීම ඉතා වැදගත්කොට සලකනු ලබයි. නමුත් රෝගය තීව්‍ර අවස්ථාවේ දී රෝගියා HDU හෝ ICU (දැඩි සත්කාර ඒකකයක) තබා රැකබලා ගැනීම අත්‍යවශ්‍ය වේ.

## රෝගය පැතිරීම පාලනය

- වෛරසය පැතිරීම බහුලව සිදුවන මෙම කාලවකවානුව තුළ හැකි පමණ ජනාකීර්ණ ප්‍රදේශවලින් ඉවත්ව වාසය කරන්න.
- මුඛ ආවරණ පැළඳීම අත්‍යවශ්‍ය වේ.
  - රෙදි මුඛ ආවරණවලින් ලබාදෙන ආරක්ෂාව සෑහීමට පත්විය නොහැක. නිතරම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිර්දේශිත ප්‍රමිතියෙන් යුතු ශල්‍ය මුඛ ආවරණයක් පළඳින්න.
  - මුහුණ සහ මුඛ ආවරණය ඇල්ලීමෙන් වළකින්න.
  - කසින, කිවිසින විට දී ටිෂු එකකින් මුව ආවරණය කරගන්න. එම භාවිත කල ටිෂූ, පියන සහිත කසල බඳුනකට ආරක්ෂිතව බැහැර කරන්න.
- නිතරම සබන් යොදා දෙඅත් හොඳින් සෝදන්න. අවම වශයෙන් තත්පර 20 ක් පමණ මේ සඳහා වැයකරන්න.
- ඔබ නිතර අත ගැටෙන ස්ථාන (දොරගුළු) විෂබීජහරණය කරන්න.
- ආසාදිත පුද්ගලයන් සමඟ භාණ්ඩ හුවමාරුවෙන් වළකින්න.
- අසාදිත පුද්ගලයකු සමග සමීප ඇසුරක් තිබුණේ නම් හෝ ඔබ සමීපව ඇසුරුකළ පුද්ගලයකු අසාධිතයකු බවට දැනගන්නට ලැබුණේ නම්, එම දින සිට දින 14 ක් ඔබ තනිව වාසය කරන්න. අන් අයගෙන් වෙන්ව වාසය කරමින් මෙම මාරාන්තික වෛරසය ඔබගේ ආදරණීයයන්ට බෝවීම වලක්වා ගැනීමට කටයුතු කරන්න.
- එම දින 14 තුළ ඔබ යම් කිසි රෝග ලක්ෂණ පෙන්වන්නේ නම් වහාම වෛද්‍යවරයකු හමුවන්න. අවශ්‍ය වන්නේ නම් PCR පරීක්ෂණයක් මගින් ඔබ අසාදිතයෙකු දැයි සැක හැර දැනගන්න.

අපගේ ආදරණීයයන් මෙම රෝගයෙන් මුදවා ගත හැක්කේ අපටම පමණි. අනවශ්‍ය ලෙස නිවසින් බැහැර නොවන්න. මෙම ගෝලීය වසංගත තත්ත්වයෙන් තමා, තම පවුල සහ තම සමාජය ආරක්ෂා කර ගැනීම අප සතු වගකීමක් වන අතර, එය නොපිරිහෙලා ඉටුකරමු.



**ඩබ්. ඒ. ටී. සෙව්වන්දි**
හෙද නිලධාරිනී
ආසාදන පාලන ඒකකය

# SOCIAL MEDIA SECURITY

## Five tips that will help you stay safe in Social Media

1. Privacy and security settings exist for a reason: Learn about and use the privacy and security settings on social networks. They are there to help you control who sees what you post and manage your online experience in a positive way.

2. Once posted, always posted: Protect your reputation on social networks. What you post online stays online. Think twice before posting pictures you wouldn't want your parents or future employers to see. Recent research found that 70 percent of job recruiters rejected candidates based on information they found online.

3. Keep personal info personal: Be cautious about how much personal information you provide on social networking sites. The more information you post, the easier it may be for a hacker or someone else to use that information to steal your identity, access your data or commit other crimes such as stalking.

4. Know and manage your friends: Social networks can be used for a variety of purposes. Some of the fun is creating a large pool of friends from many aspects of your life. That doesn't mean all friends are created equal. Use tools to manage the information you share with friends in different groups or even have multiple online pages. If you're trying to create a public persona as a blogger or expert, create an open profile or a "fan" page that encourages broad participation and limits personal information. Use your personal profile to keep your real friends (the ones you know and trust) up to date with your daily life.

5. Be honest if you're uncomfortable: If a friend posts something about you that makes you uncomfortable or seems inappropriate, let them know. Likewise, stay open minded if a friend approaches you because something you've posted makes him or her uncomfortable. People have different tolerances for how much the world knows about them respect those differences.



**Mahesh Daminda**
*Executive Senior Business System Analyst*
IT Department
*Source: Stay Safe Online.org*





අපගේ ත්‍රෛමාසික පුවත්පත සඳහා සුදුසු නමක් තෝරා ගැනීමට අපි අපගේම කාර්ය මණ්ඩලයේ අදහස් විමසා සිටියා. අප වෙත ලැබුණ යෝජිත නම් 44ක් අතුරින් වැඩිම මනාපයෙන් ජයග්‍රහණය හිමිවුයේ, හෙද නිලධාරී නෙරංජන් විජේසේකර මහතා විසින් යෝජිත "ආයුබෝවන් Melsta"නාමයයි.
නිර්මාණශීලී ඔබට අපගේ සුබ පැතුම් !

Mr. Neranjan Wijesekara
Staff Nurse – GI Center

# CONSULTANTS AND SERVICES
## උපදේශකයන් සහ සේවා

රාගම නගර මධ්‍යයේ පිහිටා ඇති ''මෙල්ස්ටා රෝහල'' රටේ ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් වඩා කාර්යක්ෂමව හා ගුණාත්මකව පවත්වාගෙන යාම සඳහා බැඳී සිටින අද්විතීය සෞඛ්‍ය සේවා සම්පාදකයෙකි. එවන් රෝහලක් වූ අප සතුව ඔබගේ ඕනෑම සෞඛ්‍ය ගැටළුවකට විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන් දෙසිය හතලිහකට අධික කණ්ඩායමක් සිටින අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඕනෑම සෞඛ්‍ය සේවාවකට අදාල ඉහළ ප්‍රමිතියකින් හා නව තාක්ෂණ දැනුමකින් යුක්ත සෞඛ්‍ය තාක්ෂණවේදී කණ්ඩායමක් ද අප රෝහල සමග සිටී.

කායික රෝග විශේෂඥ, ලය රෝග විශේෂඥ, ළමා රෝග විශේෂඥ, නව ජන්ම ළමාරෝග විශේෂඥ, හෘද රෝග විශේෂඥ, ප්‍රසව හා නාරිවේද විශේෂඥ, ආතරයිටිස් / රක්තවේද විශේෂඥ, ස්නායු රෝග විශේෂඥ, මානසික රෝග විශේෂඥ, පිළිකා රෝග විශේෂඥ, චර්ම රෝග විශේෂඥ, ලිංගාශ්‍රිත රෝග විශේෂඥ, ආහාර ජීර්ණ පද්ධතිය හා අක්මාව සම්බන්ධ විශේෂඥ, ශල්‍ය විශේෂඥ, උගුර / කණ / නාසය පිළිබද විශේෂඥ, ආමාශආන්ත්‍රික ශල්‍ය විශේෂඥ, අක්ෂි රෝග පිළිබඳ විශේෂඥ, උරස් කුහරය ආශ්‍රිත රෝග පිළිබඳ විශේෂඥ, ප්ලාස්ටික් ශල්‍ය විශේෂඥ, ව්‍යාධිවේදි විශේෂඥ, විකලාංග ශල්‍ය විශේෂඥ, මෞත්‍ර ලිංගික රෝග විශේෂඥ, වකුගඩු රෝග විශේෂඥ, මුඛ හා හනු පිළිබඳ ශල්‍ය විශේෂඥ, දියවැඩියා රෝග පිළිබඳ විශේෂඥ, ක්ෂුද්‍ර ජීවී විද්‍යා විශේෂඥ, නිර්වින්දන විශේෂඥ, විකිරණ විශේෂඥ, ප්‍රජා සෞඛ්‍ය, ක්‍රීඩා වෛද්‍ය, පෝෂණවේදී යනාදී ඕනෑම රෝග සහ පරීක්ෂණ සඳහා වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂම සේවාවක් ''මෙල්ස්ටා රෝහල'' මගින් දවසේ පැය 24 පුරාවට ලබා දීමට සියලු පහසුකම් අප රෝහල සතුව ඇත.



ලංකාවේ විවිධ ප්‍රදේශයන් හි රජයේ රෝහල්වල සේවා සපයන පිළිගත් දක්ෂ පළපුරුදු විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් ''මෙල්ස්ටා රෝහලේ'' වෛද්‍ය සේවයට දායක වේ.

(E-channelling) හෝ දුරකථන හරහා දවසේ ඕනෑම වේලාවක දී විශේෂඥ වෛද්‍ය හමුවකට කාලය වෙන්කර ගැනීමේ පහසුකම ''මෙල්ස්ටා රෝහල'' සතුව ඇත.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෙනත් සේවා සම්පාදකයින්ට සාපේක්ෂව ''මෙල්ස්ටා රෝහල'' මගින් දැඩි සත්කාර ඒකක ඇතුළු නේවාසික පහසුකම්, විශේෂඥ වෛද්‍ය හමුවීම්, බාහිර ප්‍රතිකාර අංශය, පැය 24 හදිසි ප්‍රතිකාර අංශය, පැය 24 ඔසුසල් සේවාව, පැය 24 රසායනාගාර සේවාව, එක්ස් රේ සහ Ultra Sound Scan, CT Scan, MRI, exercise ECG, එන්ඩොස්කොපි, ශල්‍යාගාර, ලැප-රෝසකොපි ශල්‍යකර්ම, සූතිකාගාර, ළදරු දැඩිසත්කාර ඒකක, සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණ, ප්‍රතිශක්තිකරණ සේවා, පවුල් සැලසුම් සේවා, දන්ත වෛද්‍ය සේවා, රුධිර කාන්දුකරණ (Dylasis) සේවා අඛණ්ඩව නිවැරදිව සහ ගුණාත්මකභාවයෙන් යුතුව ලබා ගැනීමේ හැකියාව ඇත.

සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ නිරන්තරයෙන් වැඩි දියුණු වන තාක්ෂණය හා නව්‍යකරණය වෙමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, කාරුණික රෝගී සත්කාරය සමගින්, දැරිය හැකි ඉතා සාධාරණ මිල ගණන් යටතේ අතිවිශිෂ්ට, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබා දීම අප රෝහලේ අපේක්ෂාවයි.



**මධුභාෂිණී කෞෂල්‍යා**
කණිෂ්ඨ විධායක නිලධාරිණී
නේවාසික රෝගී අංශය



# SIX BASICS FOR CUSTOMER SERVICE

## පාරිභෝගික සුව සත්කාර සේවයේ දී භාවිත කළ යුතු මූලික කරුණු හයක්

දෙස් විදෙස් පෞද්ගලික රෝහල් ක්ෂේත්‍රයේ වසර දහඅටකට ආසන්න මා ලද අත්දැකීම් තුළින් වටහා ගත් සුවිශේෂී කාරණයක් වන්නේ, දැනටමත් ආයතනය සතු පාරිභෝගිකයන් (customers) හා අනාගත පාරිභෝගික-යන් (potential customers) ආයතනය වෙත ආකර්ෂණය කර ගත හැකි වැදගත්ම මෙවලම් වලින් එකක් (tool) වන්නේ මනා වූ පාරිභෝගික සුව සත්කාර සේවය යන්නයි (Customer Service). මනා වූ පාරිභෝගික සුව සත්කාර සේවය, නිරන්තරයෙන් ඔබ ආයතනය තරගකාරී අන් ආයතන වලින් සුවිශේෂී කොට දක්වන අතර ඔබ ආයතනයටම වෙන් වූ අනන්‍යතාවයක් ගොඩනගනු ලබයි. එම අනන්‍යතාව ආයතනයේ දියුණුවේ මාර්ගය වන අතර එම තත්ත්වය උදා කර දිය හැක්කේ ආයතනයේ කාර්ය මණ්ඩලයට පමණි. ආයතනයේ පාරිභෝගිකයින්ව තම ආදරණීය පවුලේ උදවිය මෙන් රැකබලා ගැනීම අප යුතුකම හා වගකීම වනු ඇත.

1. ඔබ තුළ ධනාත්මක ආකල්පයක් ඇති කර ගැනීම. (Develop a positive attitude in yourself)
2. ඔබ ආයනයේ භාණ්ඩ හෝ සේවාවන් පිළිබඳ මනාව දැනසිටීම. (Know your products or services)
3. පාරිභෝගිකයාට හොඳින් සවන් දීම. (Listen to the customer)
4. ඵලදායි සන්නිවේදනය පවත්වා ගැනීම. (Maintain effective communication)
5. කඩිනමින් පාරිභෝගික ගැටලු විසඳීමට යොමුවීම. (Focus on resolving customer issues quickly)
6. ගැටළු නිරාකරණයෙන් පසුව සෑම විටම පසු විපරම් කිරීම (Always follow up (Phone call, Email, Company Information)

1. ඔබ තුළ ධනාත්මක ආකල්පයක් ඇති කර ගැනීම. (Develop a positive attitude in yourself).
   - I. ඔබට ලබා දී ඇති රාජකාරිය පිළිබඳ වගකීම ගන්න. (Take responsibility for your job).
   - II. ඔබේ රාජකාරිය ඉටුකරන අවස්ථාවේ එහි වෘත්තියභාවය රකින අතර පාරිභෝගිකයා සමග මිත්‍රශීලී වන්න. (Be professional and friendly).
   - III. පාරිභෝගිකයා සමග මෘදු ලෙස හා වටහාගත හැකි ලෙස කථා කරන්න. (Speak slowly).

2. ඔබ ආයතනයේ භාණ්ඩ හෝ සේවාවන් පිළිබඳ මනාව දැනසිටීම (Know your product or services).
   - I. ආයතනයේ පුහුණු වැඩසටහන් තුළින් මෙන්ම අලෙවි ප්‍රවර්ධන අංශයෙන් කරුණු විමසා දැන ගැනීම හා සූදානම්ව සිටීම. (Talk to departments who can assist you obtaining information).
   - II. අත්පොත්, සටහන් (notices and leaflets) හෝ ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි (protocols) යාවත්කාලීන කර ගනිමින් නිතර කියවා සූදානම්ව සිටීම. (Have updated manuals, notes or policy or procedures available and refer them)
   - III. පාරිභෝගික විමසීම්වල දී හැකි ඉක්මනින් නිසි පිළිතුර සොයා ගන්න. (Find the proper answer as soon as possible).
   - IV. ඔබගේ අත්දැකීම් වලින් ඔබේම දත්ත පදනමක් සාදන්න. (Create your own data base from your experience).

3. පාරිභෝගිකයාට හොඳින් සවන් දීම. (Listen to the customer).
   - I. ගනුදෙනුකරුගේ තත්වයට සම්පූර්ණයෙන්ම ඇහුම්කන් දෙන්නේ කෙසේදැයි දැන සිටිය යුතුය. ඔබ කතා කිරීමට ප්‍රථම සම්පූර්ණ කතාවටම සවන් දීම වැදගත්ය. (Must know how to listen completely to the customer situation don't cut them off just to come to the conclusion. It is important to listen to the complete story before you start talking).
   - II. පාරිභෝගිකයා මුහුණ දී ඇති අපහසුතාවය ප්‍රකාශ කිරීමේ දී එයට සම්පූර්ණයෙන්ම සවන් දෙන්න. (Listen completely to the consumer's situation).

4. ඵලදායි සන්නිවේදනයක් පවත්වා ගැනීම. (Maintain effective communications).
   - I. ඊළඟට සිදුවීමට යන්නේ කුමක්ද යන්න පාරිභෝගිකයාට දන්වන්න. (Let the customer know what is going to happen next).

5. කඩිනමින් පාරිභෝගික ගැටලු විසඳීමට යොමුවීම. (Focus on resolving customer issues quickly).
   - I. පාරිභෝගික ගැටලුව විසඳන තුරු ඉන් ඉවත්ව නොයන්න. (Don't quit until you solve the problem).
   - II. ඔබට එය විසඳිය නොහැකි නම්, එය සුදුසුම ඉහළ නිලයක් වෙත ගෙන යන්න. (If you can't solve it, move it up to the chain of command).
   - III. ඔබේ ගනුදෙනුකරුගේ ගැටලුව විසඳීමෙන් පසු, ඔබට කළ හැකි වෙනත් යමක් තිබේදැයි නිතරම විමසන්න. (After solving your customer's problem always ask if there is anything else you can do).

6. ගැටළු නිරාකරණයෙන් පසුව සෑම විටම පසු විපරම් කිරීම. (Always follow up (Phone call, Email, company information)
   - I. ගැටලුව විසඳූ පසු, ඔබ පැය 24 ක් තුළ පසු විපරම් කළ යුතුය. එවිට පාරිභෝගිකයා තුළ ආයතනය පිළිබඳ ධනාත්මක හැඟීමක් ඇතිවනු ඇත. (After the problem has been solved, you should follow-up within 24 hours, then customer will feel better).



**රංජන ගුණතිලක**
සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්

# ISO/QUALITY AWARDS & NCQAP GOLD AWARDS

## Melsta Hospital is an internationally certified Hospital

Melsta Hospital is an internationally certified secondary care hospital in Gampaha District. It was founded in 2015 & currently got 04 international certifications. It was certified with ISO 9001-2015 Quality Management System in 2017. And Melsta Hospital is the 1st and only hospital certified with above Quality Management System from SLSI.

We are proud to say in January 2021, Melsta hospital was also certified with another 03 International certifications. In accordance, they are, **ISO 22000:2018 Food Safety Management System (FSMS), ISO 45001:2018 (Occupational Health & Safety Management System) and ISO 14001:2015 (Environment Management System).**

## අප ලැබූ ජයග්‍රහණ

වර්ෂ 1996 දී ආරම්භ කරන ලද ගුණාත්මක සහ ඵලදායිතාවය සඳහා වූ ශ්‍රී ලංකා සංගමය අප රටේ මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද, පිලිගැනීමක් හිමි අන්තර්ජාතික මට්ටමෙන් පලදායිතාවය ඉහල නැංවීම සඳහා ගුණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, ඵලදායිතා සංස්කෘතියක් ඇති කරලීමට ඵලදායිතා සංකල්ප සහ ශිල්පිය ක්‍රම ප්‍රවර්ධනය කිරීමටත් දැවැන්ත ක්‍රියාවලියක යෙදී සිටින ආයතනයකි.

එම ආයතනය මගින් සෑම ආයතනයකම සිටින සෑම තරාතිරමකම සේවක මණ්ඩලය හට ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර මට්ටමෙන් ඔවුන්ගේ ඵලදායිතාවන් ඉහල නැංවීමේ අවස්ථාවන් සහ ඒ තුළින් ලැබුවා වූ සාර්ථකත්වය ප්‍රදර්ශනය කිරීම පිණිස සංවිධානය කර තිබූ තරගාවලියට Dialysis, Marketing, Procurement, Quality Assurance යන දෙපාර්තමේන්තුවලින් අප රෝහල නියෝජන කරමින් කණ්ඩායම් 4ක් සහභාගී විය. අප සතු සාමුහිකත්වය, කණ්ඩායම් හැඟීම සහ ජයග්‍රහණය කරා එකම අරමුණකින් කටයුතු කිරීමට අප සැමට ඇති ශක්තිය ද පෙන්වමින් අප රෝහලෙන් ඉදිරිපත් වූ කණ්ඩායම් 4ම එකම කණ්ඩායමක් ලෙස 2021 මාර්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවති සම්මාන ප්‍රධානෝත්සවයේ දී ඇගයීමට ලක් විය. තව ද අන්තර්ජාතික මට්ටමේ තරගාවලියට සහභාගී වීම සඳහා ද සුදුසුකම් ලබන්නේ රන් සම්මාන ලබා ගත් කණ්ඩායම් පමණක් වීම ද අප කණ්ඩායම් හතරම ඒ සඳහා සුදුසුකම් ලැබූ බව ද සඳහන් කල යුතුමයි.





සාමුහිකත්වය සහ කණ්ඩායම් හැඟීමෙන් යුතුව අරමුණක් වෙත යාමෙන් සාර්ථකත්වය ළඟා කර ගත හැකි බවට ආදර්ශයක් එක් කරමින් අප රෝහලට කීර්තියක් ගෙන ඒමට දායක වූ අපේම කාර්යමණ්ඩලයට අපගේ සුභපැතුම් එක්කරමු.




**රසිකා කුමාරි**
සහකාර කලමනාකාරිනී
තත්ත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව

# KIDNEY CARE CENTER

Kidney diseases are on a significant rise along with kidney stones, prostate cancer and urological issues. To address this, Melsta Hospitals Ragama has established a new Urology and Transplant center providing surgeries related to such at an affordable price.

Kidney Care Center at Melsta Hospitals Ragama offers comprehensive and specialized care for kidney diseases, with dialysis and kidney transplant surgeries performed by the best and most respected Nephrologists,

- Dr.Dinith Galabada
- Dr.S.Mathu
- Dr.Nalaka Herath
- Dr.Anura Hewageegana




**Vascular Surgeons**

- Dr.Aruna Weerasooriya
- Dr.Charith Weerasinghe
- Dr.K.Umashankar
- Dr.Thushan Goonaratne
- Dr.Ruwan Dissanayaka

They perform kidney transplants in our fully equipped modern operating theaters. Dr. Anoma Liyanage is the Coordinator of the entire Kidney transplant Center.

Ensuring the best care possible for recovery and a successful outcome. Post transplant care is an extremely important part of the process, and our experienced team will ensure the best care possible for a speedy recovery, with close monitoring of kidney function and vigilance for early signs of rejection, administration of medications and so on. We are dedicated to provide a continuous follow up after the transplant to give the patient the best outcome. We continuously strive to improve our services and maintain our expert ranking in the industry.

Our Hospital also offers arthroscopic donor hysterectomy for living kidney donors. This minimally invasive surgery results in a shorter hospital stay, less pain and scarring for the donor and better outcome for the recipient.

**Transparency and Ethics**

There is an ethical altruistic screening process first which is conducted with our own independent donor authorization screening committee, with five professionals, before final authorization is given by the Director General of Health Services, Ministry of Health, Sri Lanka.

We also have the assistance with obtaining aid from the President's Fund and all kidney transplants have to be approved by the Ministry of Health, Sri Lanka.

We performed our first kidney transplant surgery in February 2021 to a very deserving patient completely free of charge to mark the first year anniversary of melsta hospitals. As a responsible and inclusive entity it has successfully reduced prices of many medical procedures including OPD, surgeries, theater charges, and room rates.

Today Melsta Hospitals Ragama stands as one of the fastest growing healthcare providers in the country. It has meticulously invested in various infrastructure, technology, resource and quality developments. The hospital has a high-end Operation theater, ICU, Renal ICU, Dialysis Unit, Emergency department, and Laboratory facility managed by Melsta Labs.

**The Greatest Wealth is Health.**
Kidney Transplant Team
Melsta Hospitals




# EMPLOYEE OF THE MONTH



මානව සම්පත යනු ඕනෑම ආයතනයක ඇති වටිනාම වත්කමයි. ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, තාක්ෂණය, යනාදී ඕනෑම දෙයක් පවත්නා ආකාරයෙන්ම හෝ ඊට වඩා උසස් තත්වයෙන් අනුකරණය කිරීමට හෝ ක්‍රියාවේ යෙදවීමට හැකියාව තිබේ. නමුත් අනුකරණය කළ නොහැකි එකම දේ වන්නේ මානව සම්පත පමණි. එබැවින් එම සුවිශේෂි වූ මානව සම්පත ඇගයීමට ලක් කිරීමේ තවත් එක් සංකල්පයක් ලෙස මානව සම්පත් අංශය මගින් "Employee of the Month" සෑම මසකම ඇගයීමකට ලක් කරනු ලැබේ.

මේ සඳහා අපට ලැබෙන නිර්දේශිත නාමයන් සියල්ල අප රෝහල් ජ්‍යෙෂ්ඨ කලමනාකාරිත්වය විසින් ලබා දෙන මනාප අතරින් වැඩිම මනාප හිමි අය එම මාසයේ "Employee of the Month" ලෙස ඇගයීමට පාත්‍ර වේ. මෙහිදී ලබා දී ඇති නිර්ණායකයන්ට අනුව පැවරී ඇති රාජකාරියෙන් ඔබ්බට යමින් රෝහල වෙනුවෙන් කැපවෙමින් විශිෂ්ට සේවාවක් ලබා දෙන්නට කැපවෙන, එදිනෙදා කරන රාජකාරියෙන් පියවරක් හෝ ඉදිරියට යමින් සුවිශේෂී සේවාවක් ලබා දෙන ඕනෑම අයෙකු මේ සඳහා සුදුසුකම් ලබයි. තමන් සමග රාජකාරි කරන ඇගයීමට ලක්වීමට සුදුසු යැයි හැගෙන ඕනෑම අයෙකු මේ සඳහා නිර්දේශ කිරීමට හැකියාව තිබේ.

## 2021 වසර සඳහා තේරී පත්වුණු "Employee of the Month" සහ නිර්දේශිතයන්

| MONTH | EMPLOYEE OF THE MONTH | NOMINATIONS | |
|---|---|---|---|
| JANUARY |  **Ms. Anushka Arunalanda** Medical Record Assistant |  **Mr. Clarence Perera** Snr. Supervisor Maintenance & Facilities |  **Mrs. Madubhashini** Executive IP Services |
| FEBRUARY |  **Ms. Rasika Kumari** Assistant Manager Quality Assuarance |  **Mr. Chamith Chathuranga** Ward Master Grade II |  **Mr. Sheron Vithushan** Biomedical Engineer |
| MARCH |  **Mrs. Chapa Hansini** Senior Executive - HR |  **Mrs. Chandima perera** Staff Nurse Grade - II |  **Mrs. Niduni Edirisinghe** Staff Nurse Grade -1 |
| MAY |  **Mrs. W. A. T. Sewwandi** Staff Nurse Grade 1-B |  **Mr. Chamith Chathuranga** Ward Master Grade II |  **Mrs. Aruna Dharme** Deputy Chief Nursing Officer |
| JUNE |  **R H Priyantha** Ambulance Driver |  **Dinusha Tharangani** Assistant Nurse |  **R Suramya** Staff Nurse Grade - IIB |

*Your unique perspective adds so much to our team. We are so grateful to have you with us!*





# ප්‍රවේසමෙන් වැඩ කිරීම කාගේ වගකීමක්ද ?

ඔබත් මමත් රැකියාවේ නිරතවන රෝහල වෙන කවරදාකටත් වඩා ආරක්ෂිතව වැඩ කළයුතු ස්ථානයක් බවට අද වන විට පත්ව තිබේ.

මුළු ලොවක්ම මුහුන දෙන කොවිඩ් (Covid 19) වසංගත තත්ත්වය හමුවේ සාමාන්‍ය ආයතනයක රැකියාව කරන පිරිසට වඩා, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියාව කරන අප ආරක්ෂිතව සහ සැලකිලිමත්ව රාජකාරි ඉටු කළ යුතු කාලයක් උදා වී තිබේ.

ප්‍රවේශමෙන් වැඩ කිරීමටත් තමන්ගේ ආරක්ෂාවේ වගකීම තමන් සතු බවත් සැම විටම මතක තබා ගන්න.

පෙර නොවූ ලෙස අලුත්ම නීති රීතීන් වලට අවනතව ස්වයං වාරණයන් පවත්වා ගනිමින් කටයතු කරලීමට අපට සිදුව ඇත. පෙර ලෙස එකට එක්ව ආහාර ගැනීමට, පෙර පරිදි විවිධ සැමරුම්, උත්සව, උපන් දින සැමරුම් කිසිවක් කරන්නට නොහැකි වාතාවරණයක් උදා වී ඇත.

සෞඛ්‍ය තත්ත්වය ගැන වෙන කවරදාටවත් වඩා විමසිලිමත් වීමටත්, තමන්ගේ පමණක් නොව පවුලේ අයෙකුගේ හෝ සෞඛ්‍ය තත්ත්වයේ කිසියම් හෝ වෙනසක් ඇති වුවහොත් ඒ ගැන විමසිලිමත් වෙමින් රැකියාවට පැමිණීමට පෙර ඒ ගැන අප රෝහලේ අදාල පාර්ශවයන් දැනුවත් කරලීමටත් වගකීමක් ඔබටත් මටත් පැවරී තිබේ.

වෙනදා විදුලි සෝපානය නිරන්තරයෙන් භාවිත කළ ද අද වන විට අත්‍යවශ්‍යම කාරණාවකට හැර එය භාවිත කළ යුතු ද, එහි පිරිස වැඩිපුර සිටින බව හැඟී ගියහොත් විදුලි සෝපානය භාවිත නොකර පඩිපෙළ භාවිත කිරීමට අපටම හිතෙන තරමට තත්ත්වය වෙනස් වී ඇත.

නමුත් ඒ සෑම පියවරක්ම අප ගනු ලබන්නේ අපගේත්, අප කාර්ය මණ්ඩලයේත් අපගේ නිවසේ සිටින ආදරණීය දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, සැමියා/බිරිඳ, දුවා දරුවන් වෙනුවෙන් බව මතක තබා ගන්න.

ආරක්ෂක ඇදුම්, අත් ආවරණ, මුව ආවරණ නිසි ප්‍රමිතියෙන් යුතුව නිවැරදිව භාවිතා කරන්න. ඒවා නිසිලෙස භාවිතා කිරීම අනවශ්‍ය දෙයක් යැයි නොසිතන්න. එය ඔබගේත් අන් අයගේත් ජීවිතයේ ආරක්ෂකයා විය හැක.

සෞඛ්‍ය අංශයේ සේවය කරන ඔබ, වෛද්‍ය, හෙද, අනිකුත් කාර්ය මණ්ඩලය, පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය මින් කවරකට අයත් වුවත් ඔබ සියලු දෙනා කටයුතු කරන්නේ කැපවන්නේ රෝගී ජීවිත සුවපත් කරලීමට බව මතක තබා ගන්න.

වෛද්‍ය සහ හෙද කාර්ය මණ්ඩල රෝගීන් වෙනුවෙන් කැප වෙද්දී අනිකුත් සියලුම කාර්ය මණ්ඩලය ඔවුන්ට අවශ්‍ය සේවාවන් සපයමින් රෝහලේ කටයුතු පවත්වා ගෙන යාම පිණිස තම රාජකාරීන් ඉටු කරමින් සිටී.

ඉතින්, එබැවින් සෞඛ්‍ය අංශයේ, ඔබ සැම රටට අවැසිම පුරවැසියන් වේ.

රැකියාවකට එහා ගිය මෙහෙවරක් ඉටු කරන ඔබ සැබවින්ම වීරයෙකි/වීරවරියකි.

රැකියාව වෙනුවෙන් හෝ අන් අය වෙනුවෙන් කැපවීම අන් අයගේ ජීවිත ආරක්ෂා කිරීමට වෙහෙසීම සෑම කෙනෙකුට කළ හැකි කාර්යයක් නොවේ.

එය කළ හැක්කේ සෞඛ්‍ය අංශයේ සිටින ඔබ වැනි දයාබර හදවත් හිමි අයටම පමණි.

සුවහසක් ගිලනුන් සුවපත් කරන ඔබටත්, එම කාර්ය මණ්ඩලයන් සඳහා සහය ලබාදෙමින් තම වගකීම් කොටස ඉටු කරන අනිකුත් කාර්ය මණ්ඩලයටත් ඔවුන්ගේ පවුල්වල සියලුම ආදරණීයයන්ටත් එම ආශීර්වාදය නිසැකවම ලැබෙනු ඇත.

දවස අවසානයේ දී ඔබ ආරක්ෂාකාරීව එන තුරු ඔබගේ ආදරණීයයන් බලා සිටී. ඔවුන් වෙනුවෙන් ඔබගේ යුතුකම ඉටු කරන්න.

මුළු ලොවක් එක්ව සටන්කරන කොවිඩ් උවදුර හමුවේ එයට සාර්ථකව මුහුණ දෙමින් අන් අයගේ ජීවිත ආරක්ෂා කරන අතරම අප ද ආරක්ෂා විය යුතුම බව හැමවිටම සිහි තබා ගන්න.

මෙම අසීරු කාලය නිමාවන තෙක් ඉවසීමෙන්, පරිස්සමෙන් සහ අවබෝධයෙන් කටයුතු කරන්න. තව ද ආරක්ෂිතව රැකියාවේ නියැලෙමින් රට වෙනුවෙන් ඔබගේ යුතුකම ඉටු කරන්න.

ඔබ මිල කල නොහැකි මානව සම්පතක් බව, නැවතත්, නැවත නැවතත් මතක තබා ගන්න.



**ගයනි අබේසිංහ**
විධායක නිලධාරිනී
මානව සම්පත් අංශය

## Dear all, Congratulations on your well-deserved promotions !

# STAFF PROMOTIONS



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| M.N.P Rajah | Head of Finance | Chief Manager | Finance |
| Senisha De Silva | Manager-Human Resources | Manager | HR |
| S.H. Hettiarachchi | Head of Procurment | Manager | Supply Chain |
| A.G Munasinghe | Coordinator | Senior Executive | Common |
| W.D.C Hansini | Senior Executive - H. R. | Senior Executive | HR |
| G.K.D Niroshani | Asst. Manager Gen. Procurment | Assistant Manager | Supply Chain |
| W.R Kumari | Asst. Manager Quality Assurance | Assistant Manager | Common |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| E.G.S.N. Madumekala | Assistant Accountant | Senior Executive | Finance |
| W.U.S Jayasinghe | Senior Billing Assistant | Officer | Finance |
| W. M. K Silva | In House billing asst. Grade 1 | Officer | Finance |
| M.V.N Sandamali | Senior Cashier | Officer | Finance |
| D.S.K.A.S Dilrukshi | Cashier Grade 1 | Officer | Finance |
| T.N.K Gamage | Resident Medical Officer | Senior Executive | Medical Clinical |
| N. Rathnathilake | Resident Medical Officer | Senior Executive | Medical Clinical |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| W.M.S Pushpakumara | Dietician | Executive | Medical Clinical |
| W.A.H.N Perera | CHANNELLING ASST. GRADE 1 | Officer | Channelling |
| U.D.L Chethana | CHANNELLING ASST. GRADE 1 | Officer | Channelling |
| R.P.C.K. Rajapakshe | STAFF NURSE GRADE 4 | Officer | Nursing |
| N.G.D.W.S. Amarasinghe | STAFF NURSE GRADE 3-B | Officer | Nursing |
| R.A Dilrukshi | STAFF NURSE GRADE 4 | Officer | Nursing |
| D.P.A.P. Jayasinghe | STAFF NURSE GRADE 4 | Officer | Nursing |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| A.M.R Awanthika | STAFF NURSE GRADE 4 | Officer | Nursing |
| G.H Kanthi | STAFF NURSE GRADE 2 | Officer | Nursing |
| P.S. Pathirana | STAFF NURSE GRADE 1 | Officer | Nursing |
| W.A.T Sewwandi | STAFF NURSE GRADE 1-B | Officer | Nursing |
| T.H.S. Jeewani | NURSING SISTER GRADE 1 | Executive | Nursing |
| P.S.H Perera | STAFF NURSE GRADE 1-B | Officer | Nursing |
| R.T Meegoda | STAFF NURSE GRADE 1 | Officer | Nursing |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| B.M.W.A. Iroshini | STAFF NURSE GRADE 3 | Officer | Nursing |
| D.K.D.D. Jayantha | WARD MASTER GRADE 1 | Executive | Nursing |
| S.P. Wijekoon | STAFF NURSE GRADE 1 | Officer | Nursing |
| A.G.D Jeewani | STAFF NURSE GRADE 2 | Officer | Nursing |
| L.P.I. Ihaladeniya | Staff Nurse Grade 2 | Officer | Nursing |
| W.B.M.C. Chaturanga | WARD MASTER GRADE 2 | Junior Executive | Nursing |
| H.P.C.M. Amarasekara | STAFF NURSE GRADE 1-B | Officer | Nursing |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| K.A.I.T. Gunathilake | STAFF NURSE GRADE 1 | Officer | Nursing |
| H.B. Chandrasiri | STAFF NURSE GRADE 1-B | Officer | Nursing |
| N.P Subadra | NURSING SISTER GRADE 1 | Executive | Nursing |
| S.M.A.L.G.D Menike | STAFF NURE GRADE 1 | Officer | Nursing |
| W.N.A Wijesekara | STAFF NURSE GRADE 2 | Officer | Nursing |
| E.D.C Sanjeewani | STAFF NURSE GRADE 1-B | Officer | Nursing |
| V.A.I.S Gunasekara | Staff Nurse Grade 2-B | Officer | Nursing |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| W.G.S.H Perera | STAFF NURSE GRADE 1 | Officer | Nursing |
| R.L.D.C.U Perera | STAFF NURSE GRADE 2 | Officer | Nursing |
| W.A.P Dilrukshi | Staff Nurse Grade 1-B | Officer | Nursing |
| P.H.M. Godage | STAFF NURSE GRADE 2 | Officer | Nursing |
| S.D.V.N Dampegama | STAFF NURSE GRADE 3 | Officer | Nursing |
| U.L.P.A. Liyanage | STAFF NURSE GRADE 1 | Officer | Nursing |
| A.S. Viduranga | STAFF NURSE GRADE 4 | Officer | Nursing |



| Name | Promoted Designation | Employment Category | Unit |
|---|---|---|---|
| B.A. Chandrakumara | In Charge IP Pharmacy | Executive | Pharmacy |
| W.B.S.T Fernando | SENIOR CUSTOMER CARE OFFICER | Officer | PR |
| W.C.S De Soysa | JUNIOR EXECUTIVE PR | Junior Executive | PR |
| K.M.M Kaushalya | Executive IP Services | Executive | PR |
| H.M.K.S.K. Herath | In Charge Radiographer | Executive | Radiology |
| D.G.P. Chathurangani | Jnr. Exeu.-Warehouse Operations | Junior Executive | Storess |

● Name ● Promoted Designation ● Employment Category ● Unit

# කැටපත් පවුර

## ගීයක මිහිර .........

තොපේ හෝ නුඹ නතරවී - කාට හෝ ජීවිතය දී
තුටින් නම් මට ඒ ඇති
මගේ නොවුනට කම් නැතී නුඹ ...
මගේ නොවුනට කම් නැතී...

උන්නු දා අපි අපේ වී
දුන්නු සෙනෙහස අරුමැතී - ලෝභ නෑ සිත අභිමිදා අද
මමත් දැන් මට හිමි නැතී...

නුඹ ළඟත් මතකය ඇතී
නමුදු අපි වෙන්වී ඇතී - එපා රිදවුම් ගන්න දිවියට
අපිට හිමි ජීවිත ඇතී...

- තරුණාරත්න දිවුල්ගනේ -

වර්තමාන සමාජයේ නිරන්තරයෙන් අප දකින අසන්නට ලැබෙන සමාජ ගැටලුවක් වන්නේ, පෙම්වතුන් පෙම්වතියන් සිය ප්‍රේමය බිඳවැටුණු පසු තම ජීවිතයෙන් වගේම අනෙකාගෙන් පළිගැනීමට පෙළඹීමයි. සදාකාලික නොවූ ලෝකයක සදාකාලික කිසිවක් සොයාගැනීමට නොහැකියි යන යථාර්ථවාදී දර්ශනයට අනුගතව සිතන්නට වගේම ලැබීම හා නොලැබීම අභියස නොසැලී සිටීම යන ධර්මතාව සමාජගත කරන්නට රචකයා උත්සහ දරන්නේ ප්‍රේමය වැනි සිත සසල කරවන ප්‍රස්තුතයක් තුළිනි.

ආදරය යනු අධ්‍යාත්මය හා බැඳුණු චෛතසිකයකි. යමෙකුට සත්‍ය වශයෙන්ම ආදරය කළේ නම් නොලැබීම අභියස වෛර කිරීම කළ හැකිද? යන්න සංවාද කළ යුතු මාතෘකාවකි. ආදරය යනු අතීතයේ පැවතුණු හා වර්තමානයේ පවතින චෛතසිකයක් ලෙසින් දකින්ට රචකයා මෙම ගීය තුළින් උත්සහයක් දරයි.

තොපේ හෝ නුඹ නතරවී - කාට හෝ ජීවිතය දී
තුටින් නම් මට ඒ ඇතී
මගේ නොවුනට කම් නැතී නුඹ ...
මගේ නොවුනට කම් නැතී...

මෙහි එන පෙම්වතා සහ පෙම්වතිය දැඩිව ආදරයෙන් වෙළී සිටියේය. වර්තමානයේ ඔවුනට ඔවුන් හමුවී නැත. එනම් ඔවුන් විවාහ වී නැත. පෙම්වතා හට වෙන් වුණු දා සිට මේවන තෙක් ඇය හමු වී හෝ නැත. ඔහු තවමත් ඇයට ආදරය කරයි. එම ආදරයේ ඇති විශේෂත්වය නම් අයිති කර ගැනීමක් නොවීමයි. කුමක් හෝ බලපෑමක් නිසා ඔවුනට විවාහ වන්නට නොහැකි වූවා වගේම වෙන්වන්නට ද සිදුවූවා. ඒ ආදරයේ මිහිර සුන්දරත්වය මතක්වන විටත් මෙහි එන පෙම්වතාහට හටගන්නේ ප්‍රේමාන්විත හා කරුණාබර හැඟීමකි. ඔහු නිරන්තරයෙන් ඇයගේ දියුණුව දුක සැප සොයා බැලුවේය. අදත් ඔහු සිය පෙම්වතිය හට දුකක් කරදරයක් නොවේවා යැයි ප්‍රාර්ථනා කරයි. ඔහු අනුමාන කරන්නේ මේ වන විට ඇය කාගේ හෝ වී ඇති බවයි. එනම් ඔහු වගේම වෙන කෙනෙකු සමග විවාහ වී ඇත යනුවෙනි. ඔහු මෙහිදී කියන්නේ ....කාට හෝ ජීවිතය දී ... යනුවෙනි.

ඇයගේ ආදරය ලැබෙන්නේ යම් කෙනෙකු ද ඔහුට ඇය ඇගේ ආදරය සමගින් ඇය ජීවිතයම කැප කරන විශිෂ්ඨ පෙම්වතියක් බව ඔහු හොඳින්ම දන්නා කරුණකි. එලෙස ඔහු ඇය තුළ වූ විශේෂත්වය එක් වචනයකින් පැහැදිළි කරයි. ඔහු ගේ හිතේ යම් ආකාරයට ඇය ඔහුට හිමි නොවීම පිළිබඳ අහිංසක දුකක් ඇති වෙනවා වගේම එය ක්ෂණිකව නැතිවී යයි. නමුත් ඔහුට දැන් හිතට වද දෙන කරුණ නම් ඇය සතුටින්ද නැතිද යන්න සොයා ගැනීමයි. ඔහු නිරන්තරයෙන් ප්‍රාර්ථනා කළේ ඇය ගේ සතුට හා දියුණුවයි එහිදී ඇය සඳහටම කායිකව අයිති කරගනීමක් සිදු නොවුනත් ඔහුට ඉන් කම් නැත.

මොවුන් වෙන්වී දැන් දිගු කලක් ගතවී ඇත. ඔහු කියන්නේ එදා ආදරයෙන් ඔවුන් ඔවුන්ම වී සිටි කාලයේ ලද සෙනෙහස ඔහුට තවමත් පුදුම සහගත බවයි. එක් ආකාරයකට ඔහුට වර්තමානයේ එවන් ආදරයක් හිමි නොවනවා විය හැකියි. ඔවුන් සමාජය ඉදිරියේ විවාහ වී සිටියේ නැතත් ඒ අරුම සහගත ආදරය නිසා ඔවුන් ඔවුන්ගේ වී සිටියෝය. ඒ ලද ආදරයේ අරුමය නම්, ඔහුට ඇය හමු නොවුනත් අදටත් ඔහුට ලෝභකමක්, දුකක් දැනෙන්නේ නැතිවීමයි. ඒ ලද ආදරය නිසා ප්‍රේමයේ සෑම පාර්ශවයක් ම අතුරු සිදුරු නැතිව පිරී ඉතිරී තිබිණි.

උන්නු දා අපි අපේ වී
දුන්නු සෙනෙහස අරුමැතී - ලෝභ නෑ සිත අභිමිදා අද
මමත් දැන් මට හිමි නැතී...

අවසන ඔහු කියන්නේ දැන් ඔහුටත් ඔහුව හිමි නැති බවයි. ඔහු ව්‍යංගයෙන් කියන්නේ ඔහු විවාහ වී ඇති බව හා ගොඩනැගුණු වගකීම් රැසක් ඔහු වටා ඇති බවයි. ඔහුට හිතුමතේ තීන්දු තීරණ ගන්නට එදාමෙන් දැන් නොහැකිය. සමහර වෙලාවට එවන් බැඳීම් ඇති නොවන්නට ඔහු ඇයව සොයා යන්නට තිබුණි. ඔහු මේ තුළ සඟවන අනෙක් කරුණ නම්, ඇයද එවන් බැඳීම් සමග හිරවී හෝ රැකියාවේ කාර්ය බහුල බව නිසා ඔහු පිළිබඳ නොසොයා සිටිනවා මිස ඇය ඔහුව අමතක කර දමා නැති බවයි. එලෙස මතක් කරමින් සතුටු වන්නට හැකි සුන්දර ආදරයක් ඔවුන්ට හිමිව තිබුණි. එමෙන්ම අද ඔවුන් වෙන කෙනෙකුගේ වුවත් කිසිදු දුකක් නොමැතිව දිවි ගෙවන්නේ ඔවුන්ගේ ආදරයේ අතීත සුන්දරත්වය හා තුළ වූ අසීමිත පහස තුරුළු කරගෙන සිටින නිසාවෙනි.

අතීත මතකයන් දෙදෙනා ළඟම ඇති බව පෙම්වතා තරයේ විශ්වාස කරයි. ඒ එතරම් ම අවබෝධයෙන් යුතුව ඔවුන් ගේ වී දිවි ගෙවූ නිසාවෙනි. පෙම්වතා මෙහිදී සිය අතීත පෙම්වතියට යෝජනාවක් කරන්නේ,

නුඹ ළඟත් මතකය ඇතී
නමුදු අපි වෙන්වී ඇතී - එපා රිදවුම් ගන්න දිවියට
අපිට හිමි ජීවිත ඇතී...

එනම් ඔවුන් දෙපල කෙතරම් ආදරයෙන් අසීමිත සෙනෙහසින් ගතකළ අතීතයක් තිබුණත්, ඒ සොඳුරු අතීත මතකයන් සමග වර්තමානයේ අඩු ලුහුඩුකම් මකාගෙන තෘප්තිමත්ව ගතකළත්, යථාර්ථය නම් සැබෑ ලෙසම ඔවුන් ඔවුන්ගේ නොවන බවයි. එනම් ඔවුන් සැබැවින්ම වෙන් වී ඇත. ඒ නිසා ඔහු අතීත පෙම්වතියට කියන්නේ කිසිම විටෙක ජීවිතයට රිදවුම් නොගන්නා ලෙසයි. දුක් නොවන ලෙසයි. මක් නිසාද යත් දැන් ඔවුනට හිමි ඔවුන්ගේ වෙන වෙනම ජීවිත ඇති නිසාය.

ආදරය වටහා ගැනීම, කැපකිරීම් හා පරිත්‍යාගයන් තුළින් ගලා යන්නකි. එමෙන්ම පවතින තත්තවයන් තුළ ආදරය විඳිම ඒහි අධ්‍යාත්මීය පහස තුළ ජීවත් වීම තවත් පැතිකඩකි. අනෙකාගේ සතුට වෙනුවෙන් පරිත්‍යාග කිරීම, අනෙකාගේ දියුණුව වෙනුවෙන් ක්‍රියා කිරීම සැබෑ ආදරයේ දී සිදුවිය යුතුය. එලෙස ගලා යන ආදරයක් විවාහය හරහා නොගියත් ඇය හෝ ඔහු වෙන කෙනෙකු හට හිමි වුවත් පසුතැවීමක් දුකක් ඉතිරි වන්නේ නැත. ඉතිරිවන අධ්‍යාත්මීය සුවය හා ලද මතකයන් ඔවුන් මිය යන තුරාවට ජීවිතයේ කුමන බාධක පැමිණියත් ඔවුන්ව ජීවත් කරන්නට සමත් වන නිසාවෙනි. ආදරයෙහි ඇති ආධ්‍යාත්මීය සුවය තුළ කිසිදා ද්වේශය ට, වෛරය ට ඉඩක් නොමැත. විලක ඇති මල් එම විලෙහිම තිබියදී පූජා කරනා බඳු නිරාමිෂ සතුටකි.

විචාරය - සමීර
ගීයක මිහිර සිංහල සුභාවිත ගීත විචාරය හා රසවින්දනය කවය

---

තනියම විඳින්න ජීවිතේ....
ඔබ සෑහසිල්ලේ දිවි ගෙවාවි
කිසිදා කිසිවෙකු මත,
ඔබේ දිවියේ පැවැත්ම,
ඔබේ නිදහස,
තීරණය වීමට ඉඩ නොතබන්න....
නැතිනම් ඔබ ජීවත් වූවත්,
මිය ගියා හා සමාන වේවි...

සචී..

සචිනි රණතුංග
පාරිභෝගික සේවා නිලධාරිනී

---

நம்பாக்கை

மாறுதலுக்கான வாசல்
எக்காலத்துக்கும்
திறந்தேயிருக்கிறது,
அது நம்மிலிருந்து
முதல் அவியை எடுத்து வைத்த
அடுத்த கணம் அதனை
அடைவதற்கான அனைதது
சக்திகளையும் பிரபஞ்சம்
நமககாக உருவாக்கிக
கொண்டேயிநக்கும்....
உறுதியாக நம்புங்கள்.....

Ethyagarajah Dhakshini
QA Department

---

எத்தனை முறை விழந்தாலும் துணிவே
துணை எண்று நிற்பேன்...
விழுவதும் எழுவதும் என்க்கு புதிதல்ல...
எண்ணங்கள் எனினமயாக இருந்தால்,
செயல்கன் வலிமையாக இருக்கும் !

Y. saujanya
Finance Department

---



වෙසක් සඳේ සඳ කිරණින් මුළු ලොව නැහැවෙන්නේ
වෙනදා මෙන් කුඩු තොරණ් අපට මෙදා නැහැනේ
කූඩු ගොඩක් සෑදීමට මල්ලී නැහැනෙ දෙන්නේ
කොරෝනාව මේ ලෝකෙන් දුරු වී යන්නේ

නෙත්ම පැහැසර (මලිනි කුලරත්න - Dialysis Unit)

---

සැවොම එක්වෙලා - COVID පරදලා
තුටින් ලංවෙලා - හිඳිමු හිනැහිලා
කරවටා අත් දමා - පාසලේ දඟ කෙරුව
යහළුවෝ ඈත ඈත - අල්ලන්න බෑ නේද

ගුරුතුමී දකින්නේ - රූපයෙන් විතරමයි
ඇගෙ සුවඳ නෑ අපට - වෙනද මෙන් දැනෙන්නේ
අනේ අපිට තවත් බෑ - තවත් කොටු වෙලා ඉඳින්නට
කොවිඩ් මාරයෝ ඔයා - ඉතින් ඈතට යන්න

අම්මා අත්‍යවශ්‍යමයි - රැකියාවට යන්න
අපි තනිව ගෙදරමයි - නෑ එළියට වත් යන්න.
ඒ වුණත් ඇය අනේ - ගෙදර එන විට රෑට
මටත් ආඩම්බරයි - ඇය මගේ මව වීම

අපිට නැති නිදහස - එපා අනේ ඔබ ගන්න
ආච්චිලා සීයලා ඕනේ - අපිට කතා අහගන්න
සියලු දෙවි රැකගන්න - පොඩි මහළු සැමදෙනම
කොවිඩ් මාරයෝ ඔයා - ඉතිං ඈතට යන්න

රවිඳු සන්ජුල් අලහකෝන් (මහේෂිකා කුමාරි - Dialysis Unit)
ශාන්ත අන්තෝනි විදුහල, වත්තල.

---

වහන් වී හැම නෙතින්
දුරස් වී මිතු දමින්
ඈත් වී.. මිටරෙන් .. දෙතෙන්
මුව පුරා ආවරණ පැළඳුවත්
වහන් වෙන්නට සිතා
ඉඩ නොවිය රැකගන්න
නුඹේ ජීවිතය වටිනා...

දෙඅත් බැඳ ඇවිදයන
මුව පුරා හිනැහෙන්න
නිදහසේ ඇවිද ගොස්
හුස්ම බිඳුවක් ගන්න...

පෙර ලෙසට දරුවන්ට
කෙළි සිනා පතුරන්න
හැකි වෙයිද යළි කෙදින
ජය කෙහෙලි නංවන්න

හුස්ම බිඳුවක් යදිනා
අහිංසක මිනිසුන්ට.
සැනසුම් සුසුමක් වන්න
පෙළ ගැසෙමු අපි සැවොම
ගෝලීය වසංගතය
පරදවා හිනැහෙන්න

විඩාබරව ගිලන් වී
දුබල වූ නුඹේ සවිය
ගොඩගන්න පෙරලෙසට
සිත සවිය මට දෙන්න
නුඹේ ජීවේ පණ ගන්න
වැහැරුණත් ගත සවිය
වියපත්ව ගිලන් වී
සෙනෙහෙබර මවකි නුඹ
සෙනෙහෙබර පියෙකි නුඹ
මා මෙන්... දරුවන් රකිනා
ඔවුන් ඇත මග බලා
නුඹ එන පෙර මග බලා

දැත් යුග දිගුකරමි
සතුටින් සිනහා පා
වෙරදෙන්න ඇවිද යනු පිණිස
පා බිම තබා....

හෙද සොයුරිය - නිශානි බෝගොඩ



යුතුල් රනුමිත
(මධුභාෂිනී කෞශල්‍යා - කණිෂ්ඨ විධායක නිලධාරිනී
නේවාසික රෝගී අංශය)




Shivani Lalith Kumar
Seventh day Adventist
high School A/L
(Mrs. Aruna Dharme - DCNO)

# Our values

## Patient - centered

Putting patients at the heart of everything we do, listening and responding to their needs and wishes.

රෝගියා - කේන්ද්‍රීය

අප කරන සෑම දෙයකදීම රෝගීන් හදවතේ තබා ගැනීම, ඔවුන්ගේ අවශ්‍යතා හා කැමැත්තට සවන් දීම සහ ප්‍රතිචාර දැක්වීම.

## Compassion

Caring for patients and their loved ones in ways we'd want for our friends and family.

අනුකම්පාව

අපි අපේ ආදරණීයයන් හා මිතුරන් රැකබලා ගන්නේ කෙලෙසින්ද, එලෙසින්ම අපි අපේ රෝගීන්ව රැක බලා ගන්නෙමු.

## Respect

Behaving and using language that demonstrates respect and courtesy to others. Zero tolerance to bullying, inequality, prejudice and discrimination

ගෞරව දැක්වීම

අන් අයට ගෞරවය හා ආචාරශීලී බව පෙන්වන භාෂාව හැසිරීම සහ භාවිතා කිරීම. කිසිදු අවස්ථාවකදී අන්අයට හිරිහැර කිරීම, අසමානතාවයෙන් සැලකීම, අගතිය සහ වෙනස් කොට සැලකීම යනාදියට ඉඩ නොතැබීම සඳහා කටයුතු කිරීම.

## Learning

We learn & raise the standards set previously by continuously learning & evolving. We welcome change & constantly look for newer & more efficient ways to achieve our goals.

ඉගෙනීම

අඛණ්ඩව ඉගෙන ගෙන පරිණාමය වීමෙන් අපි කලින් නියම කර ඇති ප්‍රමිතීන් තවදුරටත් ඉහළ නංවන්නෙමු. වෙනස අභියෝගයක් ලෙස ගෙන එය අපි සාදරයෙන් පිළිගනිමු. අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිරන්තරයෙන් නව හා වඩා කාර්යක්ෂම ක්‍රම සොයන්නෙමු.

## Excellence

Striving to be the best that we can be. Innovating and learning from others.

විශිෂ්ටත්වය

අපට ළඟාකරගත හැකි හොඳම තත්ත්වය ළඟා කර ගැනීමට උත්සාහ කිරීම. නව්‍යකරණය සහ අන් අයගෙන් ඉගෙනීම.

## Integrity

We always do the right things even when no one is watching.

අඛණ්ඩතාව

කිසිවෙකු බලා නොසිටින විට පවා අපි සෑම විටම නිවැරදි දේ කරන්නෙමු.

## Safety

Following international standards and professional guidelines. Speaking up to make sure patients and staff are safe from harm.

ආරක්ෂාව

ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ වෘත්තීය මාර්ගෝපදේශ අනුගමනය කිරීම. රෝගීන් සහ කාර්ය මණ්ඩලය අනතුරුවලින් ආරක්ෂා වන බවට වග බලා ගැනීම සඳහා කටයුතු කිරීම.

## Team work

We work together for one objective that is patient satisfaction, irrespective of teams/ departments.

කණ්ඩායම් වැඩ

කණ්ඩායම් / දෙපාර්තමේන්තු නොසලකා, උපරිම රෝගී තෘප්තියක් සඳහා අපි එකට වැඩ කරමු.

SPONSORED BY




MAKE SURE YOU GIVE THE MOST SAFE AND CONVENIENT SOLUTION FOR YOUR LOVED ONES!

THE MOST CONVENIENT **LIFTING SYSTEM FOR HANDICAPPED AND ELDERLY!**

- Vertical transportation up to 10m
- Full cabin and half cabin option
- Suitable for Indoor/ Outdoor application with cover
- Manual emergency descending during power failures and optional option for automatic
- Installation within 2 days

+94 766 464 963

chinthaka.g@hayleysaventura.com

The World Of Hayleys